ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | මුදල් මණ්ඩලයේ ලේකම් |
|---|---|
| දිනය | 2016 ජූනි 02 |

## භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ නිවේදනය

2016 මාර්තු අග භාගයේ දී සිදු කෙරුණු භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි හා අදාළව මෑතක දී පළ වූ ලිපි මෙන්ම ඒ පිළිබඳව වූ සාකච්ඡා තුළින් මතු කරන ලද එම ක්‍රියාවලියේ විනිවිදභාවය සම්බන්ධයෙන් නගන ලද චෝදනා හා බැඳේ. 2015 පෙබරවාරි සිට හඳුන්වා දෙන ලද සම්පූර්ණයෙන් ම වෙළෙඳපොළ මත පදනම්ව සිදු කරන ලද නිකුතු වෙන්දේසි ක්‍රියාවලිය ම මෙම චෝදනාවන්ට බඳුන් වූ වෙන්දිසි තුළදී ද අනුගමනය කරන ලද බව මහජනතාවට දැනුම් දෙනු කැමැත්තෙමු.

රජයේ විශාල සම්පත් අවශ්‍යතා පිළිබඳව මුදල් මණ්ඩලය සැලකිල්ලට ගෙන ඇත. අමතර වශයෙන් 2016 වසර මුල දී මූල්‍ය ප්‍රතිපත්ති අවශ්‍යතාවයන් මත සිදු කරන ලද ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයන් හි ඉහළ දැමීම මෙන්ම අනතුරුව සිදු කරන ලද ප්‍රතිපත්ති පොලී අනුපාතයන් හි ඉහළ දැමීම ද හේතු කොට ගෙන භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරයන් හි ඵලදා අනුපාතයන් ඉහළ යන ලදී.

පවතින හා ඉදිරියේ දී පැන නැගිය හැකි රජයේ මූල්‍ය අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන මුදල් මණ්ඩලය විසින් පහත සඳහන් නිර්දේශයන් සිදු කර ඇත.

1) අදාළ කළමනාකරණ කණ්ඩායම් විසින්,

   (අ) වෙන්දේසියක් සිදු කිරීමට පෙරාතුව වෙළෙඳපොළ තත්ත්වයන් පිළිබඳව සියලු ප්‍රාථමික අලෙවිකරුවන් සමඟ සාකච්ඡා කිරීම හා පැහැදිලි හා නිශ්චිත නිකුතු වෙන්දේසි කාල සටහනක් පවත්වා ගැනීම.

   (ආ) ප්‍රසිද්ධ වෙන්දේසි සම්බන්ධව කරන ලද නිවේදනයන්හි අපේක්ෂිත නිකුතු ප්‍රමාණයන්ට සාපේක්ෂව පිළිගන්නා ලද ප්‍රමාණයන් සම්බන්ධයෙන් ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන් අධ්‍යයනය කොට මහ බැංකුව විසින් අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය පිළිබඳව මුදල් මණ්ඩලයට යෝජනා කිරීම

2) සේවක අර්ථසාධක අරමුදල සක්‍රීය ලෙස ප්‍රාථමික වෙන්දේසි සඳහා සහභාගී වීම.